# පටුන


සංස්ථාපිත තොරතුරු 02

සභාපතිතුමාගේ පණිවිඩය 03

පාලන භාරකාරතුමාගේ පණිවිඩය 04

1. **අරමුදලේ පසුබිම**
   - භාරකාර මණ්ඩලය
   - 2016 වසරේ අරමුදලේ කාර්යය මණ්ඩලය
   - සංවිධාන ව්‍යුහය
2. **2016 වසරේ අරමුදලෙහි කාර්යසාධනය**
   - 2016 වසරේ ප්‍රතිලාභීන්
   - ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රගතිය
   - නිකුත් කල ණය සීමාවන් හා ණය මුදල් වටිනාකම
   - ණය අයකරගැනීමේ ප්‍රගතිය
   - කාර්යාල සංකීර්ණය - ලෝහෝර් ආර්යා ණය අරමුදල
     - කුලී ආදායම
     - අරමුදලෙහි තිරසාරභාවය
     - මෙහෙයුම් ආදායම
3. **අරමුදලේ පරිපාලනමය හා මානව සම්පත් සංවර්ධනය**
   - සේවක අභිප්‍රේරනය ඉහළ නැංවීම
   - උසස්වීම් පටිපාටීන්
   - නව බඳවා ගැනීම්
   - අරමුදල් පරිශ්‍රය වැඩි දියුණු කිරීම
   - කාර්යාල කටයුතු නවීකරණය
   - කාර්ය මණ්ඩල ණය
   - ලේක් හවුස් ආයතනය තැන්පතු මුදල් නිදහස් කිරීම
   - ඇප බැඳුම්කර
   - රැස්වීම්
   - විගණන හා කළමනාකරණ කමිටුව
4. **අනාගත සැලසුම්**
5. **ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව**
6. **ආදායම් ප්‍රකාශය**
7. **ශේෂපත්‍රය**
8. **ආදායම් ප්‍රකාශය**
9. **මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්**
10. **බද්ධකරණය කිරීම**

# ලෝහෝර් ආර්යා ණය අරමුදල

## දැක්ම

රාජ්‍ය අංශයේ සේවකයින්ට මූල්‍ය පහසුකම්

සලසා දෙනු ලබන ප්‍රධානතම ආයතනය ලෙස ක්‍රියා කිරීම.

## මෙහෙවර

රාජ්‍ය අංශයේ සේවකයින් ණය බරින් මිදවීම හා ආපදාවකදී සහන සැලසීම මගින් තෘප්තිමත් මහජන සේවයකට දායක වෙමින් යහපත් රාජ්‍ය සේවයක් නගාසිටුවීමට දායකවීම.

## අභිමතාර්ථය

රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා හා පළාත් පාලන ආයතන වලසේවයේ නිරත සේවකයින්ට සහනශීලි පොලී ප්‍රතිශතයක්

යටතේ පහසු කොන්දේසි මත කෙටිකාලීන ණය මුදල් කඩිනමින් ලබා දීම මගින්

ඔවුන් ණය බරින් මුදවා ගැනීම.

## කාර්යභාරය

- ණය අරමුදල තිරසාරව පවත්වා ගනිමින් ප්‍රතිලාභීන් සඳහා ණය ලබා දීම.
- ආයතනික ප්‍රවර්ධනය සහ ධාරිතාවය වැඩි කිරීම.
- අරමුදල් සම්පාදනය කර ගනිමින් ආයතනය පවත්වා ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීම හා ක්‍රියාත්මක කිරිම.
- ණය කළමණාකරනය සඳහා යෝග්‍යවන ක්‍රමෝපායන් දියුණු කිරීම සහ ණය දීමේ පහසුකම් වැඩි දියුණු කිර

## සංස්ථාපිත තොරතුරු

**ආයතනයේ නම ලිපිනය :**

- ලෝහෝර් ආර්යා ණය අරමුදල
- 100/ 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

**සංස්ථාපිත කිරීම :**

- 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල භාරකාර මණ්ඩල පනත (1953 සංශෝධිත) යටතේ ස්ථාපිත මුදල් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත ආයතනයකි.

**භාරකාර මණ්ඩලය :**

- ඒ. පී. කුරුම්බලපිටිය මහතා - සභාපති (අධ්‍යක්ෂක - රාජ්‍ය ගිණුම් දෙපාර්තුමේන්තුව)
- එස්.වින්ස්ටන් පතිරාජ මහතා - පාලන භාරකාර
- ඩබ්.ඩී.ජයසිංහ මයා - සාමාජික
- වසන්ත පෙරේරා මහතා - සාමාජික
- මර්ලින් දිසානායක මිය - සාමාජික

**විගණන කමිටුව :**

- පී.බී.එස්.සී. නෝනිස් මහතා - සභාපති, (අධ්‍යක්ෂ, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව)
- ඩබ්.ඩී.ජයසිංහ මයා - සාමාජික
- මර්ලින් දිසානායක මිය - සාමාජික

**විගණක** : රන්වත්ත සහ සමාගම,
වරලත් ගණකාධිකාරී,
141/3 වොක්ෂල් වීදිය,
කොළඹ 02.

**සේවාවන් ලබා ගන්නා බැංකුව** : මහජන බැංකුව,
මූලස්ථාන ශාඛාව,
කොළඹ 02.

# සභාපතිතුමාගේ පණිවිඩය

රාජ්‍ය අංශයේ සේවකයන් හට මූල්‍ය පහසුකම් සලසා දෙනු ලබන ප්‍රධානතම ආයතන බවට පත්වීම නව දැක්ම කරගත් ලෝහෝර් ආර්යා ණය අරමුදලේ 2016 වර්ෂයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පසුවිපරමක් කිරීමේදී 2015 වර්ෂයට සාපේක්ෂව 2016 දී දැක්වූ ප්‍රගතිය මෙන්ම දුබලතා ද හඳුනාගැනීම, ඒ සඳහා හේතු පාදක වූ කරුණු මෙන්ම 2017 වසර සඳහා ගත යුතු ඉදිරි පියවර ද සමාලෝචනය කිරීම නිවැරදි දැක්මක් ඇතිව අරමුදලේ කාර්යයන් මෙහෙයවීම සඳහා ඉවහල් වෙනු ඇත. එහිදී ප්‍රධාන වශයෙන් අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය වන ණය පොළී ආදායම 2015 වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 14 කින් පමණ වැඩි වුවද ණය ලබාදුන් සංඛ්‍යාවෙහි 20% ක පමණ අඩුවීමක් පෙන්නුම් කරයි. එබැවින් 2017 වර්ෂයේදී ණය ඉල්ලුම්කරුවන් ප්‍රමාණය වැඩිකර ගැනීම සඳහා විශේෂයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ණය ඉල්ලුම් කිරීමේ පහසුකම ලබාදීම පෞද්ගලික අංශයෙහි සේවකයන් හට ද ණය පහසුකම් ලබාදීමට ඇති නීතිමය හැකියාව පරීක්ෂා කර ඒ සඳහා ඉඩ ප්‍රස්ථා ලබාදීම සහ අතිරේක අරමුදල් රැස්කිරීම මගින් වැඩිපුර ඉල්ලුමක් ඇති රුපියල් 250,000 ක ණය කාණ්ඩය වැඩිකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට ද අපේක්ෂා කරයි. එමෙන්ම 2016 වසරේදී නව තක්සේරු වටිනාකම් මත වඩාත් විශ්වාසදායී ගනුදෙනුකරුවන් සමඟ ඉහළ කුලී ගාස්තු යටතේ ගිවිසුම්වලට එළඹීමට හැකි විය. මෙමගින් ඉදිරි වර්ෂවලදී මෙම ආදායම් මූලාශ්‍රයෙහි වර්ධනයක් අපේක්ෂා කළ හැක.

විශේෂයෙන් රජයේ කිසිදු ඍජු මූල්‍ය ප්‍රතිලාභයක් නොලබා වාර්ෂිකව විශාල බදු මුදලක් අරමුදල විසින් රජයේ ඒකාබද්ධ අරමුදලට ලබාදීම මගින් රාජ්‍ය අංශයේ අනෙකුත් පාඩු ලබන හා ඒකාබද්ධ අරමුදලට බරක් වන ආයතනවලට ආදර්ශයක් ලබාදී ඇත. විශේෂයෙන් නිසි සැලැස්මක් හා මූල්‍ය විනයක් සහිතව විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීම මගින් සීමිත සම්පත් සහිතව වුවද මහා භාණ්ඩාගාරයට අමතර බරක් නොවන පරිදි කටයුතු කළ හැකි බව අරමුදල පසුගිය වසර කිහිපය පුරා ඒකාබද්ධ අරමුදල ලබාදුන් දායකත්වය දෙස බැලීමෙන් පැහැදිලි වේ.

අවසාන වශයෙන් 2016 වසර තුළ අරමුදල අත්පත් කරගත් ප්‍රගතිය කෙරෙහි ඍජුව හා වක්‍රව නන් අයුරින් දායක වූ පාලන මණ්ඩල සාමාජිකයන් හට මෙන්ම සියලුම සේවක මහත්ම මහත්මීන් හට මාගේ විශේෂ ස්තුතිය පිළිගැන්වීමට කැමැත්තෙමි. විශේෂයෙන් ආයතනයේ ප්‍රධානතම සම්පත වන සේවක මණ්ඩලයේ කැපවීම නොමැතිව පාලන මණ්ඩලයට පමණක් ආයතනයේ ප්‍රගතිය ළඟා කරගත නොහැකි බැවින් ඔවුන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් මෙතෙක් ගෙන ඇති පියවරවලට අමතරව ඉදිරියේදී වඩාත් ප්‍රතිලාභ හිමිවන වැඩපිළිවෙලකට යොමුවීම කෙරෙහි ද අවධානය යොමු වී ඇත.



ඒ.පී. කුරුම්බලපිටිය

සභාපති

ලෝහෝර් ආර්යා ණය අරමුදල

# පාලන භාරකාරතුමාගේ පණිවිඩය



ලෝහෝර් ආර්යා ණය අරමුදලේ ආයතන ප්‍රධානියා ලෙස පාලන භාරකාර යන තනතුර හා බැඳී පවතින වගකීම් හා කාර්යභාරයන් ප්‍රකාරව 2015 වසරේ වාර්ෂික වාර්තාවේ සඳහන් පරිදි මෙම ආයතනය පැවති තත්වයට වඩා සැලකිය යුතු මට්ටමේ වර්ධනයක් ඇති කරලීම සඳහා ප්‍රමාණවත් කාර්යයන් ගණනක් සිදුකර එමගින් ආර්ථික කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම හා මානව සම්පත් සංවර්ධනය කිරීම 2016 වසර තුලදී ප්‍රතිව්‍යුහකරණ ක්‍රියාවලිය යටතේ සිදු කරන ලදී

වසර ගණනක් පුරා පැවති සම්ප්‍රදායික ණය ක්‍රමය පුළුල් කිරීම ප්‍රතිව්‍යුහකරණ ක්‍රියාවලිය තුලින් හැකිවී ඇති අතර එය ත්‍රයි භාෂාවෙන් ප්‍රකාශයට පත්කර ඇති නව පහසුකම් සහිත ආයතනික නිල වෙබ් අඩවියක් ප්‍රතිස්ථාපනය කිරීමටද ඉවහල් විය. වර්තමානයේදී ණය අයදුම්පත් නිල වෙබ් අඩවියෙන් බාගත කරගැනීමට හැකිවීම තුලින් බොහෝ කලක් කොළඹ දිස්ත්‍රික්කයට පමණක් සීමා වී තිබූ ණය ක්‍රමය දෙවුන්දර තුඩුවේ සිට පේදුරුතුඩුව දක්වා දිවයිනේ සියලුම ප්‍රදේශ වලට අප අරමුදලින් ණය ලබා ගැනීමේ සමාන හැකියාවක් මේ තුලින් හිමිවිණි.

රාජ්‍ය සේවකයින්ට තම මූල්‍ය අවශ්‍යතා ක්ෂණිකව සපුරා ගැනීමට ඉඩසලසමින් ඉල්ලුම් කරන දිනයේ සිට දින 03 ක් ඇතුලත සිය ණය මුදල් ලබාගැනීමට හැකිවීම සහ ණය අයදුම්පත් භාරදුන් දිනයේ සිට ණය ඉල්ලුම්කරුවන්ට මෙම ණය ලබාගැනීමට අරමුදල වෙත පැමිණිය යුතු වාර ගණන 02ක් දක්වා සීමා කර ඇත. දුර බැහැර ප්‍රදේශවල සේවයේ නියුතු රාජ්‍ය සේවකයින්ට තම ඇපකරුවන් සමග අරමුදල වෙත පැමිණිය හැකිනම් ණයකරුට එදිනම තම චෙක්පත ලබාගැනීමට හැකිවන පරිදි විශේෂ පහසුකම් සලස්වා ඇත. මෙම ජයග්‍රහණය අත්පත් කරගැනිමට හැකි වූයේ පාලන භාරාකාරතුමා ඇතුලු ආයතනික කාර්යමණ්ඩලය එක් කණ්ඩායමක් ලෙස සිය කාර්යභාරයන් ඉටුකරලීම හේතුවෙන් අප ආයතනයට සිය අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කරගැනීමට හැකිවීම නිසාය. ණය ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්ට වඩා පුළුල් සේවාවක් සැපයීම අරමුණින් දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ පැවැත්වූ සාකච්ඡා ඉතාම සාධනීය තත්ත්වයක් අත්පත් කරගෙන තිබේ.එහි ප්‍රතිඵලයක් ලෙස, ණය යෝජනා ක්‍රම සඳහා වන ඉල්ලුමේ සැලකිය යුතු දියුණුවක් දැකිය හැකි විය . එනම්, මාණ්ඩලික නිලධාරීන් සඳහා ලබා දෙන රු. 250,000/- ක ණය මුදල හා සාමාන්‍ය රාජ්‍ය සේවකයින්ට ලබා දෙන රු. 100,000/- ණය සඳහා වන ඉල්ලුමෙහි ඉතා සාධනීය වර්ධනයක් අත්පත් කර ගැනීමට මෙම යාන්ත්‍රණය ඔස්සේ හැකිවුනි.

ආයතනයේ සුභසිද්ධිය උදෙසා ගත් පියවර අතර මූල්‍ය හා පරිපාලන කළමනාකරණයෙහි පැවති අකාර්යක්ෂමතා මුලුමනින්ම පාහේ දුරැලීම සඳහා ගත් ක්‍රියාමාර්ග තුලින් ආයතනික කටයුතු විධිමත් වීමෙන් විවිධ අංශයන් යටතේ අරමුදලේ කාර්යමණ්ඩලයේ පරිමාව සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු වීමෙන් තෘප්තිමත් පාරිභෝගික සේවාවක් සැපයීමට හැකිවිණි. එමෙන්ම දීර්ඝ කාලයක් මුළුල්ලේ පරිහානියට පත්වෙමින් තිබූ අරමුදල් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමෙන් සහ නවීකරණය කිරීම තුලින් අරමුදලින් වන කාර්ය භාරයට සහ ඉන් සිදුකරන සේවාවට ගැලපෙන නව මුහුණුවරක් ලබා දීමටද හැකිවිනි.

අරමුදල සංස්ථාපිත පනතේ ප්‍රතිපාදන වලට යටත්ව අරමුදලේ මූල්‍යධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ආයෝජන,ප්‍රධාන,ආධාර.ආදීය ආකර්ෂණය කරගැනීමට ඇති අවස්ථාවන් පිළිබද මේ වන විටත් කටයුතු අධ්‍යනය කරමින් පවතී.මේ අනුව පුද්ගලික අංශයට ණය සේවා සැපයීම තුලින් අප අරමුදලේ මූල්‍ය වත්කම තව දුරටත් පුළුල් කිරීම සඳහාත් ඇති අවස්ථා පිළිබඳ මේ වන විටත් කටයුතු අධ්‍යනය කරමින් පවතී.භාණ්ඩාගාරයෙන් ආධාර ලබාගත් නමුත් මුදල් හිඟකම නිසා අරමුදලට ආධාර කිරීමට භාණ්ඩාගාරයට නොහැකි විය. කෙසේ වුවද, පනතෙහි විධිවිධාන යටතේ මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමට විදේශ සබඳතා නිවැරදිව සම්බන්ධ කර ගැනීම සඳහා නිර්දය ලෙස කටයුතු කරන්නෙමු.

ඉහත අරමුණු සපුරා ගැනීම සඳහා කැපවීමෙන් සහ ඵලදායී ලෙස දායකත්වය දැක්වූ කාර්ය මණ්ඩලයට හා භාරකාර මණ්ඩලයට මෙන්ම මුදල් අමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුලු ප්‍රධානීන්ගෙන් ලද මාර්ගෝපදේශයත්, සහයෝගයත් කෘතඥ පූර්වකව සිහිපත් කරමින් ලෝහෝර් ආර්යා ණය අරමුදලේ ආයතනික දැක්ම, මෙහෙවර සහ අරමුණු ශක්තිමත් කිරීමටත් අරමුදල පිහිටුවාලූ අරමුණ සාක්ෂාත් කරගැනිමටත් මම අඛන්ඩව මාගේ වැයම ධනාත්මකව සහ ඵලදායී ලෙස යොදවමි.



පාලන භාරකාර

ලෝහෝර් ආර්යා ණය අරමුදල



# 01
# අරමුදලේ පසුබිම

ලංකාවේ කලක් වාසය කල ස්කොට්ලන්ත ජාතික ජීන් ලෝහෝර් ආර්යාව විසින් ණය අරමුදලක් පිහිටුවීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය සඳහා පවුම් 300 ක මුදලක් පරිත්‍යාග කර තිබිණි. එවකට පූණ්‍ය කොමසාරිස්ව සිටි සී.ඊ.වී.නැතනියල් දේවගැතිතුමා අරමුදල පිහිටුවීමේ කාර්යයෙහි මූලිකව කටයුතු කර ඇති අතර එය 1927 මාර්තු 26 වන දින ලෝහෝර් ආර්යා ණය අරමුදල නමින් ආරම්භ කරන ලද අතරම 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා අරමුදල් පනත මගින් ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත් විය.

එදා සිට මෙම අරමුදල ප්‍රතිලාභීන් වෙත ණය ප්‍රදානය කරමින් සහ ඒවා ආපසු අයකර ගනිමින් චක්‍රිය අරමුදලක් ලෙසින් ක්‍රියාත්මක වෙමින් පවතී. රාජ්‍ය අංශයේ මෙන්ම වෙළඳ සමාගම්වල සේවය කරන සේවකයින්ටද තමන්ගේ කෙටි කාලීන මුදල් අවශ්‍යතා සපුරා ගැනීමට එවකට පැවති බැංකු ක්‍රමයෙන් පිටිවහලක් නොලැබුන හෙයින් ඔවුන් අධික පොළියට ණය සපයන පුද්ගලයන්ගෙන් ණය ලබා ගැනීමට පුරුදුවී සිටියහ. මේ පසුබිම තුල රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවකයින්ද ණය බරින් පීඩනයට පත්විය. මෙවැනි පරිසරයක් තුල ලෝහෝර් ආර්යා ණය අරමුදල පිහිටුවීමෙන් පසු මෙම සේවකයින්ට ණය ලබා ගැනිමේදි ඉමහත් සහනයක් සැලසුනි. 1951 මෙම පනත ව්‍යවස්ථාගත වීමත් සමගම අරමුදලට රජයෙන් මෙන්ම වෙනත් පරිත්‍යාගශීලීන්ගෙන් ද ලැබුන ආධාර උපයෝගී කරගෙන මෙම ආයතනයටම අයත් තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ඇත.

## 1.1 භාරකාර මණ්ඩලය

භාරකාර මණ්ඩලය ගරු ඇමතිතුමා විසින් පත් කරනු ලබන රාජ්‍ය අංශයේ සහ සුදුසුකම් ලත් පෞද්ගලික අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විත වේ. මෙම ආයතනයෙහි අනුශාසකධූරය මුදල් අමාත්‍යතුමා විසින් හොබවනු ලබයි,. අරමුදලෙහි පරිපාලන කටයුතු සඳහා පාලන භාරකරුවකු 10 වන හා 11 වන වගන්ති ප්‍රකාරව භාරකාර මණ්ඩලය සඳහා පත් වු අය අතරින් කෙනෙකු පත්කරනු ලැබේ. එම පනතෙහි 5 වන වගන්තියට අනුව භාරකාර මණ්ඩලයෙහි සභාපති තනතුර භාණ්ඩාගාර නියෝජිතවරයා වෙත පවරා ඇත.



## 1.2 වගුව 01 – 2016 වසරේ අරමුදලේ කාර්යය මණ්ඩලය

| අනුමත තනතුර | | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව |
|---|---|---|---|
| ගණකාධිකාරී | | 01 | 01 |
| පරිපාලන නිලධාරි | | 01 | 01 |
| ගිණුම් නිලධාරි | | 01 | 01 |
| අභ්‍යන්තර විගණන නිලධාරි | | 01 | 01 |
| ණය අයකර ගැනීමේ නිලධාරී | | 01 | 01 |
| තොරතුරු තාක්ෂණ නිලධාරි | | 01 | 01 |
| කළමනාකරණ සහකාර- තාක්ෂණික නොවන ශ්‍රේණිය (ලේඛනාගාර සහකාර ඇතුළු) | } | 33 | 33 |
| ගොඩනැගිලි අධීක්ෂක (කළමනාකරණ සහකාර - තාක්ෂණික ශ්‍රේණිය) | | 01 | 01 |
| කාර්යාල කාර්ය සහායක<br>නිල බංගලා භාරකරු | } | 06 | 06 |
| රියදුරු | | 02 | 02 |
| **එකතුව** | | **48** | **48** |

## 1.3 සංවිධාන ව්‍යුහය



# 2

# 2016 වසරේ අරමුදලෙහි කාර්යසාධනය

## 2.1 2016 වසරේ ප්‍රතිලාභීන්

2016 වසරේදී රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු සේවකයින් 3676 ක් මෙම අරමුදලේ ප්‍රතිලාභීන් වී ඇත. එම ප්‍රතිලාභීන් පදිංචි දිස්ත්‍රික්කය අනුව දෙවන වගුවෙහි වර්ගීකරණය කර ඇති අතර 2016 වර්ෂයේදී පෙර වසරට සාපෙකෂව ණය ප්‍රමාණයේ 20.7% ක අඩු වීමක් දක්නට ලැබුණද ණය මුදල් ප්‍රමාණයේ පෙර වසරට සාපෙක්ෂව 7.07% ක ප්‍රගතියක් දක්නට ඇත. ප්‍රතිලාභීන්ගෙන් 75% අධික පිරිසක් ආරක්ෂක අංශයේ නියුතු පුද්ගලයින් වන බව තුන්වන වගුවෙන් නිරූපනය වේ

**වගුව 02 – 2015 / 2016 වර්ෂවල ණය ලබා ගත් රාජ්‍ය හා**

**අර්ධ රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක අනුව**

| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | **2016** | (%) | 2015 | (%) |
| කොළඹ | 531 | 14.44 | 664 | 14.32 |
| ගම්පහ | 561 | 15.26 | 541 | 11.67 |
| අනුරාධපුරය | 257 | 6.99 | 334 | 7.20 |
| මහනුවර | 205 | 5.58 | 314 | 6.77 |
| වව්නියාව | 04 | 0.11 | 07 | 0.15 |
| කළුතර | 338 | 9.19 | 367 | 7.92 |
| රත්නපුර | 154 | 4.19 | 206 | 4.44 |
| ගාල්ල | 205 | 5.58 | 246 | 5.31 |
| කුරුණෑගල | 368 | 10.01 | 498 | 10.74 |
| පුත්තලම | 52 | 1.41 | 83 | 1.79 |
| යාපනය | 01 | 0.03 | 01 | 0.02 |
| පොළොන්නරුව | 107 | 2.91 | 134 | 2.89 |
| ත්‍රිකුණාමලය | 15 | 0.41 | 26 | 0.56 |
| මුලතිව් | 03 | 0.08 | 09 | 0.19 |
| මන්නාරම | 0 | 0.00 | 11 | 0.24 |
| බදුල්ල | 146 | 3.97 | 208 | 4.49 |
| මාතලේ | 77 | 2.09 | 134 | 2.89 |
| හම්බන්තොට | 111 | 3.02 | 119 | 2.57 |
| කෑගල්ල | 212 | 5.77 | 259 | 5.59 |
| මඩකලපුව | 04 | 0.11 | 01 | 0.02 |
| අම්පාර | 68 | 1.85 | 84 | 1.81 |
| මොනරාගල | 93 | 2.53 | 164 | 3.54 |
| නුවරඑළිය | 58 | 1.58 | 62 | 1.34 |
| මාතර | 107 | 2.91 | 164 | 3.54 |
| එකතුව | **3676** | **100** | **4,636** | **100** |




**ප්‍රස්තාරය -01 2015 / 2016 වර්ෂවල ණය ලබා ගත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක අනුව**

**වගුව 03 - 2015 හා 2016 වර්ෂවල රාජ්‍ය සේවා ප්‍රතිලාභීන් තනතුරු අනුව**

| තනතුර | **2016** | **2015** |
|---|---|---|
| කෝප්‍රල් | 1117 | 1,723 |
| හමුදා සෙබල | 699 | 1,054 |
| හමුදා සැරයන් | 121 | 281 |
| මේජර් | 16 | 27 |
| ලුතිනන් | 8 | 37 |
| අරක්කැමි | 28 | 22 |
| භෝජනාගාර සේවක | 32 | 20 |
| පොලිස් කොස්තාපල් | 496 | 344 |
| පොලිස් සැරයන් | 120 | 106 |
| පොලිස් පරීක්ෂක | 31 | 15 |
| උප පොලිස් පරීක්ෂක | 28 | 14 |
| පොලිස් ආරක්ෂක සහායක | 23 | 08 |
| පොලිස් සිවිල් සහායක | 0 | 22 |
| ගිනිභටයන් | 15 | 18 |
| රියදුරු | 105 | 99 |
| බන්ධනාගාර නියාමක | 26 | 56 |
| මැනුම් සහායක | 26 | 28 |
| සෞඛ්‍ය පරිපාලක | 0 | 04 |
| උපස්ථායක | 3 | 07 |
| සාමාන්‍ය කම්කරු | 232 | 261 |
| කාර්යාල කාර්යය සහායක | 226 | 209 |
| කළමනාකරණ සහකාර | 116 | 137 |
| සංවර්ධන සහකාර | 9 | 06 |
| මුරකරු | 11 | 08 |
| මෝටර් කාර්මික | 4 | 09 |
| කාර්මික ශිල්පි | 0 | 04 |
| වඩු කාර්මික නිලධාරී | 4 | 04 |
| මානව සම්පත් සහකාර | 0 | 10 |
| පරිපාලන නිලධාරී | 1 | 04 |
| පෙදරේරු | 3 | 04 |
| ගණකාධිකාරී | 5 | 04 |
| ගබඩා සහායක | 1 | 06 |
| විදුලි කාර්මික | 1 | 03 |
| ඕවර්සියර් | 1 | 05 |
| තැපැල් නිලධාරී | 4 | 22 |
| සහකාර අධ්‍යක්ෂක | 2 | 06 |
| පිළිගැනීමේ නිලධාරී | 1 | 02 |
| පොත් බැඳුම්කරු | 3 | 10 |
| ග්‍රාම නිලධාරී | 0 | 05 |
| වැඩසටහන් සහකාර | 3 | 05 |
| කොමිෂන් නොලත් නිලධාරි | 4 | 0 |
| බලලත් නිලධාරි | 9 | 0 |
| මැනුම් ක්ෂේත්‍ර සහායක | 6 | 0 |
| හෙද නිලධාරී | 9 | 0 |
| කපිතාන් | 23 | 0 |
| අස්ගොව් | 5 | 0 |
| විදුලි පහන් දල්වන්නා | 1 | 0 |
| යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 0 |
| තාක්ෂණ නිලධාරී | 1 | 0 |
| තැපැල්කරු | 3 | 0 |
| පරිවර්තක | 1 | 0 |
| කර්නල් | 5 | 0 |
| පෙර පාසල් ගුරු | 2 | 0 |
| පුස්තකාලාධිපති | 1 | 0 |
| අධ්‍යක්ෂක | 4 | 0 |
| වෙනත් | 81 | 27 |
| එකතුව | **3676** | **4636** |

## 2.2 2016 ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රගතිය

පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයෙකුට මෙම අරමුදලෙන් ණය අයදුම් කළ හැක.

- ➢ විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු වසර 3 ක අවම ස්ථිර සේවා කාලයක් හිමි රාජ්‍ය සේවකයකු වීම.
- ➢ අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් වසර 5 ක අවම ස්ථිර සේවා කාලයක් සපුරා තිබීම.
- ➢ ලබා දෙනු ලබන ණය මුදල් සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට තරම් ප්‍රමාණවත් සේවා කාලයක් තිබීම.( විශ්‍රාම ගන්නා වයස් සීමාව අවුරුදු 55 ලෙස සලකයි)
- ➢ අයදුම්කරු සඳහා ඉහත සුදුසුකම් සහිත ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කිරීම.
- ➢ අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් ඇපකරුවන් දෙදෙනාගෙන් එක් අයකු අවම වශයෙන් වසර 03 ක ස්ථිර සේවා කාලයක් පවතින විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු අයකු වීම.
- ➢ සියළුම ණය අයදුම්කරුවන්ගේ මාසික වේතනයෙන් 40% සීමාව තුල ණය වාරිකය අයකර ගැනීමේ හැකියාව තිබීම.

ඉහත සුදුසුකම්ලාභීන්ගෙන් ඉදිරිපත් වූ අයදුම්පත්‍ර හා ණය නිකුත් කිරීම පිළිබඳව 2016 වසරේ ප්‍රගතිය පහත වගුවෙන් පැහැදිලි වේ

**වගුව - 04 - ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය - 2016**

| මාසය | ණය අයදුම් කළ සංඛ්‍යාව | නිකුත් කල ණය සංඛ්‍යාව | ණය වටිනාකම (රු. 000) |
|---|---|---|---|
| ජනවාරි | **228** | 343 | 28,060 |
| පෙබරවාරි | 233 | 255 | 20,100 |
| මාර්තු | 302 | 343 | 26,350 |
| අප්‍රේල් | 249 | 206 | 16,500 |
| මැයි | 307 | 345 | 29,830 |
| ජූනි | 366 | 338 | 28,520 |
| ජූලි | 372 | 304 | 25,000 |
| අගෝස්තු | 265 | 380 | 32,470 |
| සැප්තැම්බර් | 280 | 266 | 22,570 |
| ඔක්තෝබර් | 262 | 323 | 26,340 |
| නොවැම්බර් | 239 | 244 | 20,790 |
| දෙසැම්බර් | 409 | 329 | 28,470 |
| එකතුව | **3512** | **3676** | **305,000** |

**ප්‍රස්තාරය - 02 ඉහත ක්‍රියාපටිපාටිය යටතේ 2016 වර්ෂයෙදී ණය බෙදාහැරීම**




2016 වර්ෂය තුලදී ණය අයදුම් කළ සංඛ්‍යාව 3512 වුවද නිකුත් කල ණය සංඛ්‍යාව 3676 විය.මෙම අඩු වීමට හේතු සාධක නිරික්ෂණය කළ පසු එහි ප්‍රතිඵලයක් ලෙස , 2015 වර්ෂය අවසන් භාගයේදී ඇප අත්සන් කිරීමට නොපැමිණි අයදුම්පත් පැවතීමත් 2015 වර්ෂය අවසාන මාසයන් තුල දි ලද යුද හමුදාවේ ණය අයදුම් පත් සදහා ණය නිකුතුවේ දී අවශ්‍ය සී.එල් බලපත්‍ර 2016 වසර තුල ලැබීම දැක්විය හැක

## 2.3 නිකුත් කල ණය සීමාවන් හා ණය මුදල් වටිනාකම

කරුණු එසේ වුවද 2016 වසරේ දි නිකුත් කරන ලද ණය සංඛ්‍යාව පෙර වසර හා සංසන්දනය කිරීමේදී 20.7% ක අගයකින් අඩු වීමක් දක්නට ලැබුණද නිකුත් කරන ලද ණය මුදල් ප්‍රමාණය පෙර වසරට සාපේකෂව 7.07% ක වර්ධනයක් අත් කරගෙන ඇත. 2015 වර්ෂයට සාපේක්ෂව 2016 දී රු.250.000.00 ණය බාණ්ඩය යටතේ ණය නිකුත් කිරීමේදී 33.33 % ක පැහැදිලි දියුණුවක් ලගා කරගෙන තිබුනද, වැඩි පොළි ආදායමක් අරමුදල වෙත ලබා ගැනීමේ අරමුණින් අරමුදලේ මුළු ණය ප්‍රාග්ධණයෙන් වැඩි කොටසක් රු.100,000 ණය ප්‍රමාණයන් දෙසට යොමු කිරීම තුලින් 118% ක සීඝ්‍ර වර්ධනයක් අත්පත් කරගෙන ඇත.මෙම තත්වය මත අරමුදල් ප්‍රාග්ධනය සීමාවීම හේතුවෙන් නිකුත් කරන ලද ණය ප්‍රමාණයේ යම් පසුබෑමේ ස්වාභාවයක් දක්නට ලැබේ.

**වගුව 05 - ණය මුදල් සීමාවන් අනුව ප්‍රගතිය**

| උපරිම ණය සීමාව | නිකුත් කල ණය සංඛ්‍යාව | ණය මුදල් වටිනාකම (රු. 000) |
|---|---|---|
| 250,000 | 36 | 9,000,000.00 |
| 100,000 | 2347 | 234,700,000.00 |
| 50,000 | 1103 | 55,150,000.00 |
| 40,000 | 82 | 3,280,000.00 |
| 30,000 | 71 | 2,130,000.00 |
| 20,000 | 37 | 740,000.00 |
| 10,000 | 0 | 0 |
| **එකතුව** | **3676** | **305,000,000.00** |

## 2.4 ණය අයකරගැනීමේ ප්‍රගතිය

2013 හා 2016 වර්ෂයන් සංසන්දනාත්මකව නිරික්ෂණය කිරීමේදී වගු අංක 06 න් සහ ප්‍රස්ථාර අංක 03 සටහනෙන් දැක්වෙන පරිදි 2015 වර්ෂයට වඩා ණය අයකර ගැනීමේ ආකර්ෂණීය ප්‍රවනතාවයක් 2016 වර්ෂය තුලදී නිරූපණය වේ.

- *ණය මුදල් නිකුත් කිරීම* - ප්‍රගතිය - 7.07%
- *ණය* අයකර ගැනීමේ - ප්‍රගතිය - 25%

| වර්ෂය | ණය සංඛ්‍යාව | ණය නිකුත් කිරීම (රු. 000) | ණය අයකර ගැනීම (රු. 000) |
|---|---|---|---|
| **2013** | 5005 | 194,040 | 240,064 |
| **2014** | 5122 | 203,505 | 252,973 |
| **2015** | 4636 | 284,860 | 273,868 |
| **2016** | **3676** | **305.000** | **342.358** |

**වගුව 06 – 2013 සිට 2015 වසර දක්වා ණය නිකුත් කිරීම සහ ණය අය කර ගැනීම**

**ප්‍රස්තාරය -03 ණය නිකුත් කිරීම සහ අයකර ගැනීමේ ප්‍රගතිය**



## 2.5 කාර්යාල සංකීර්ණය - ලෝහෝර් ආර්යා ණය අරමුදල

### 2.5.1 කුලී ආදායම

ලෝහෝර් ආර්යා ණය අරමුදල් ගොඩනැගිල්ලේ වර්ග අඩි 5,500 ක් අරමුදලේ කාර්යාලය සඳහා භාවිතා කරමින් අතිරික්ත ඉඩකඩ ප්‍රමාණය පහත සඳහන් ආයතන වලට කුලී පදනම මත ලබා දි 2016 වර්ෂය තුල කුලී ආදායම වශයෙන් රුපියල් මිලියන 13.4 ක් උපයා ගන්නා ලදී.

**වගුව 07 – 2016 වසරේ ගොඩනැගිලි කුලී ආදායම**

| අනු අංක | ආයතනය | කුලියට සිටින මහල | වර්ග අඩි ප්‍රමාණය | ආදායම (රු.) |
|---|---|---|---|---|
| 01 | ලෝහෝර් ආර්යා ණය අරමුදල | 3 වන මහල | 5,500 | - |
| 02 | රථ ගාල | පතුල් මහල | 5,290 | - |
| 03 | ලේක්හවුස් පොත්හල(2016.01-2016.10) | බිම් මහල | 5,500 | 1217,366 |
| | ජාතික ඉතිරි කිරීමේ බැංකුව (2016-11 සිට) | | | 1050,000 |
| 04 | සමූපකාර සේවක කොමිෂන් සභාව | 1 - මහල | 2,415 | 2462,790 |
| 05 | ලංකා විදුලිබල මණ්ඩලය | 1 ,2 - මහල | 4700 | 4393,412 |
| 06 | ලංකා විදුලිබල මණ්ඩලය තොරතුරු අංශය | 2 - මහල | 2750 | 2805,000 |
| 07 | රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂම | 2 - මහල | 840 | 960,000 |
| 08 | ඒ.ජේ.එස්. ඇසෝසියේටඩ් ආයතනය | අංක :100/20 | 380 | 480,000 |
| | **එකතුව** | | **27,375** | **13,368,558** |

### 2.5.2 අරමුදලෙහි තිරසාරභාවය

අරමුදලේ මෙහෙයුම් සහ මූල්‍ය තිරසාරභාවය පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් භාරකාර මණ්ඩලයේ විශේෂ අවධානය යොමුව ඇත. මෙම අරමුදල භාණ්ඩාගාර ප්‍රදානයන් මත හෝ අයවැය ප්‍රතිපාදන මත රඳා පවතින ආයතනයක් නොවන අතර සේවක වැටුප් ඇතුළුව සියලුම වියදම් අරමුදලේ ණය පොලී ආදායම සහ ගොඩනැගිලි කුලී ආදායම තුලින් ආවරණය කරගනු ලැබේ. මෙම සියළුම මෙහෙයුම් වියදම් හමුවේ වුවද එනම් බොල් ණය, පරිපාලන වියදම් සහ ණය ආපසු අයකර ගැනිම සඳහා දැරීමට සිදුවන අනෙකුත් සියලුම වියදම් පියවීමෙන් අනතුරුව ඉතිරිවන අතිරික්තය අරමුදලේ සුරක්ෂිතභාවය තහවුරු කර ගැනීම උදෙසා මහජන බැංකුවේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇත.

**වගුව 08 - ආයෝජන**

| ආයෝජන වර්ගය | බැංකුව | 2016/12/31 (රු.) | 2015/12/31 (රු.) |
|---|---|---|---|
| ස්ථාවර තැන්පතු | මහජන බැංකුව | 76,201,532 | 90,792,272 |
| ස්ථාවර තැන්පතු | ජාතික ඉතිරි කිරීමෙ බැංකුව | 15,513,431 | - |
| **එකතුව** | | **91,714,964** | **90,792,272** |

### 2.5.3 මෙහෙයුම් ආදායම

2016 වසර තුලදී තුලදී මුළු මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 79ක් වූ අතර ශුද්ධ මෙහෙයුම් අතිරික්තය රුපියල් මිලියන 22 කි. 2015 වසර තුලදී එය පිළිවෙලින් රුපියල් මිලියන 72ක් හා රුපියල් මිලියන 17 ක් වූ අතර එය එම වසරේ ශුද්ධ මෙහෙයුම් ආදායම වූ රුපියල් මිලියන 17 ට සාපේක්ෂව රුපියල් මිලියන 21 ක වර්ධනයකි. 2016 වර්ෂයේ දිගුකාලීනව පැවති අක්‍රීය ණය ක්‍රියාවලිය අවසන් කිරීමෙන් පසු 2016.12.31 දිනට අක්‍රීය ණය ප්‍රතිපාදන වෙන් කිරීමේ ගිණුමේ තව දුරටත් පැවති ශේෂය වු රුපියල් ලක්ෂ 03 ක් 2016 වර්ෂයේ ආදායමට එකතු වීමත් පොළී ආදායම සාපේක්ෂව ඉහල යාමත් හේතුවෙන් 2016 වසර තුල එම ආදායම් වර්ධනය වුවද ඊට සාපේක්ෂව සේවක වැටුප් හා දීමනා ඉහලයාමත්, දිගු කාලීනව නවීකරණය නොකරන ලද ලෝහෝර් ආර්යා ණය

අරමුදල් ගොඩනැගිල්ල නවීකරණ කටයුතු තව දුරටත් සිදුකරගෙන යාමත් හා අනෙකුත් ආදායම් මත බදු ප්‍රතිපාදනවල විචලනයන් යන වියදම් ඉහල යාමෙන් 2016 ආදායම් ඉහල යාමට සමාන්තරව ශුද්ධ මෙහෙයුම්අතිරික්තය අඩු ප්‍රමාණයකින් වර්ධනය වී ඇත.




.

**ප්‍රස්තාර 04 - මෙහෙයුම් ආදායම සහ මෙහෙයුම් අතිරික්තය 2013-2016**

## 03

# අරමුදලේ පරිපාලනයමය හා මානව සම්පත් සංවර්ධනය

### 3.1 සේවක අභිප්‍රේරනය ඉහළ නැංවීම

2016 වර්ෂයේ සිට විවිධ ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි පවත්වනු ලබන සේවක වැඩමුළු මගින් අරමුදලේ සේවකයින්ගේ කාර්යක්ෂමතාවය, ඵලදායීතාව, සේවක තෘප්තිය,සාමූහික හැඟීම, වර්ධනය වීමත් ඒ තුලින් ඔවුන්ගේ අභිප්‍රේරණය ඇති වීම හා වැඩ කිරීමේ ධාරිතාවේ කැපී පෙනෙන ප්‍රගතියක් අත් කර ගැනීමට හැකියාව ලැබී ඇත.එම නිසා පිළිවෙලින් ආයතනික අරමුණු සහ පරමාර්ථයන් තවදුරටත් සඵලදායී කර ගැනීමේ අරමුණින් කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් පහත පරිදි පවත්වන ලදී. ඒ සඳහා වැඩි මුලා ප්‍රතිපාදන ප්‍රමාණයක් අරමුදලෙන් වෙන් කරන ලදී.

| දිනය | මෙහෙය වන ආයතනය | පුහුණු වැඩ මුළුව | සහභාගීවූ සේවකයන් |
|---|---|---|---|
| 2016.02.20 | නිපුණතා පියස | කාර්යාල කළමණාකරණය හා කාර්යාල ක්‍රමවේදය | ලේඛනාගාර සහායක |
| 2016.06.22 | සොෆ්ට් කී ආයතනය | පරිගණක පොදු ලෙජරය | 4 ( කලමනාකරණ සහාකාර 111) |
| 2016.07.02 | ආර්.එච්.පුහුණු ආයතනය | ගොඩනැගිලි නඩත්තුව සම්බන්ධව | ගොඩනැගිලි අධීක්ෂක |
| 2016.08.22 | ආර්.එච්.පුහුණු ආයතනය | නිපුණතා සංවර්ධනය වැඩ සුපරීක්ෂණය | 1 ( කලමනාකරණ සහාකාර111) |
| 2016.09.06 | ඉදිකිරීම් පුහුණු මධ්‍යස්ථානය | ආරක්ෂිත රිය පැදවීම | 1 ( රියදුරු) |
| 2016.09.19 | නිපුණතා පියස | කාර්යාල කළමණාකරණය හා කාර්යාල ක්‍රමවේදය | ලේඛනාගාර සහායක |
| 2016.09.27 | ඇඩම්ස් නිපුණතා සංවර්ධන ආයතනය | එක්ස්එල් මෘදුකාංගය | 1 ( කලමනාකරණ සහාකාර 111)<br>2 ( කලමනාකරණ සහාකාර 111) |
| 2016.10.13 | නිපුණතා පියස | ඵලදායී අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනක |
| 2016.10.20 | නිපුණතා පියස | ගබඩා කළමණාකරණය | 1 ( කලමනාකරණ සහාකාර 1) |
| 2016.10.09 | නිපුණතා පියස | සන්නිවේදන කුසලතා සංවර්ධනය | ගිණුම් නිලධාරී 11 |
| 2016.11.24 | නිපුණතා පියස | ගබඩා කළමණාකරණය | 1 ( කලමනාකරණ සහාකාර 1) |
| 2016.11.30 | නිපුණතා පියස | ඵලදායී සන්නිවේදන හා පුද්ගල සම්බන්ධතා | 1 ( කලමනාකරණ සහාකාර 111) |
| 2016.09.06 | නිපුණතා පියස | ආරක්ෂිත රිය පැදවීම | 1 ( රියදුරු) |
| 2016.09.19 | නිපුණතා පියස | කාර්යාල කළමණාකරණය හා කාර්යාල ක්‍රමවේදය | ලේඛනාගාර සහායක |
| 2016.09.27 | ඇඩම්ස් නිපුණතා සංවර්ධන ආයතනය | එක්ස්එල් මෘදුකාංගය | 2 ( කලමනාකරණ සහාකාර 111) |
| 2016.10.13 | නිපුණතා පියස | ඵලදායී අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනක |
| 2016.10.20 | නිපුණතා පියස | ගබඩා කළමණාකරණය | 1 ( කලමනාකරණ සහාකාර 1) |
| 2016.10.09 | නිපුණතා පියස | සන්නිවේදන කුසලතා සංවර්ධනය | ගිණුම් නිලධාරී 11 |
| 2016.11.24 | නිපුණතා පියස | ගබඩා කළමණාකරණය | 1 ( කලමනාකරණ සහාකාර 1) |
| 2016.11.30 | නිපුණතා පියස | ඵලදායී සන්නිවේදන හා පුද්ගල සම්බන්ධතා | 1 ( කලමනාකරණ සහාකාර 111) |
| **2016.09.06** | **ඉදිකිරීම් පුහුණු මධ්‍යස්ථානය** | **ආරක්ෂිත රිය පැදවීම** | **1 ( රියදුරු)** |

තවදුරටත් කරුණු විමසීමේදී පෙර ගණකාධිකාරී වරයාට හා පරිපාලන නිලධාරිනියට පමණක් පහසුකමක් ලෙස හිමිව පැවති තනි කාර්යාල කුටි ප්‍රධාන කාර්ය මණ්ඩලයේ අනෙකුත් නිලධාරීන් වන ගිණුම් නිලධාරී , අභ්‍යන්තර විගණන නිලධාරී , ණය අයකර ගැනීමේ නිලධාරී, සරප්, කනිෂ්ඨ කළමණාකාර II, ගබඩා භාර නිලධාරී වෙත අරමුදල විසින් සම්පාදනය කිරීම තුලින් එම නිලධාරීන්ගේ රාජකාරී කටයුතු වල සැලකිය යුතු කාර්ය සාධනීය වෙනසක් සහ කාර්යක්ෂමතාවක් නිරූපණය විය.

## ගරු මුදල් අමාත්‍ය රවි කරුණානායක මැතිතුමා අරමුදල් පරිශ්‍රය නිරීක්ෂණය සඳහා පැමිණීම වෙනුවෙන් පැවති නිල උත්සවය

පාලන භාරකාරතුමාගේ ආරාධනයකට අනුව අරමුදලේ කාර්යභාරය නිරීක්ෂණය කිරීම සඳහා ප්‍රථම වරට ගරු මුදල් ඇමති රවි කරුණානායක මහතා අරමුදල් පරිශ්‍රය වෙත පැමිණීම නිමිත්තෙන් නිල පිළිගැනීමේ උත්සවයක් පැවැත්විණ. එම නිල උත්සවය සඳහා අමාත්‍යාංශ නිළධාරීන්, අරමුදලේ භාරකාර මණ්ඩලයේ සමාජිකයන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගී විය.

**එම උත්සවයේ විශේෂ අවස්ථාවන් සහිත ඡායාරූප පහතින් දැක්වේ.**



**සම්භාවනීය අමුත්තන් පිරිස පොල්තෙල් පහන දැල් වූ අවස්ථාව.**



**ගරු මුදල් අමාත්‍ය තුමා සභාව ඇමතූ අවස්ථාව**



**ගරු මුදල් අමාත්‍යතුමා පාලන භාරකාරතුමා සමග එදින පවත්වන ලද තේ පැන් සංග්‍රහයට සහභාගී වූ අවස්ථාව.**



**ගරු මුදල් අමාත්‍යතුමා අරමුදලේ භාරකාර මණ්ඩලය සමග එදින පවත්වන ලද තේ පැන් සංග්‍රහයට සහභාගී වන අතරතුර සුහද කතාබහක යෙදී .**

## 3.2 උසස්වීම් පරිපාටින්.

අරමුදලේ ජ්‍යෙෂ්ඨතම නිලධාරිනියක වන (කණිෂ්ඨ කළමනාකරු II) 2016.11.01 දින සිට බලපවත්නා පරිදි පිළිවෙලින් හිඟ ණය වාරික මුදල් නැවත අයකරගැනීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා හා අක්‍රීය ණය ලිපිගොනු අවම කර ගැනීමේ අදහස පෙරදැරිව ණය අය කර ගැනීමේ නිලධාරී තනතුරට උසස් කරන ලදී. 2015 වර්ෂයේදී පාලන භාරකාරතුමා විසින් කළමනාකරණ සේවා දෙපාර්මේන්තුවෙන් කරන ලද ඉල්ලීමකට අනුව 2016 වර්ෂයේදී අරමුදලේ නව තනතුරු දෙකක් ස්ථාපනය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. සමාලෝචනය කරන ලද වර්ෂය තුලදී ස්ථාපිත කරන ලද එක් තනතුරක් ලෙස තොරතුරු තාක්ෂණික නිලධාරි තනතුර (කණිෂ්ඨ කළමනාකරුII) දැක්විය හැකිය.තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසාත් ආයතනයේ ණය නිකුත් කිරීම සහ ණය අයකර ගැනීමේ යාන්ත්‍රණය සරල කර ගැනීම සඳහා සහ ලිඛිතමය කටයුතු අවම කර ගැනීමත් මෙම තනතුර ස්ථාපනය කිරීමේ මූලික අරමුණ විය.

2015 වසරේදී මුදල් අමාත්‍යංශයේ සහ කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරවා ගන්නා ලද ලේඛනාගාර සහකාර සහ ගොඩනැගිලි අධීක්ෂක යන නව තනතුරු 02 හා නිළ බංගලා භාරකරුවකු යන තනතුරු සඳහා අභ්‍යන්තරික බඳවා ගැනීම් සිදු කරන ලදී. ගොඩනැගිලි අධීක්ෂක තනතුර සඳහා ගොඩනැගිලි සහායක තනතුරේ සිටි නිළධාරීයාව එම ගොඩනැගිලි අධීක්ෂක තනතුරෙහි වැඩ බලන තනතුරට පත්කරන ලද අතර ලේඛනාගාර සහකාර තනතුර සඳහා කාර්යාල කාර්ය සහායක III යන ශ්‍රේණියේ තනතුරු දරන ලද නිලධාරීයෙක්ව එම ලේඛනාගාර සහකාර තනතුරෙහි වැඩ බලන තනතුරට පත්කරන ලදී. එමෙන්ම බංගලා භාරකරු යන තනතුර සඳහා කාර්යාල කාර්ය සහායක III යන ශ්‍රේණියේ තනතුරු දරන ලද නිලධාරීයෙක්ව එම තනතුරට පත්කරන ලදී.

එමෙන්ම කළමණාකරන සහකාර II ශ්‍රේණියේ තනතුරු දැරූ ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරිනියකව ඇයගේ කාර්ය සාධනය ඇගයීමට කළමණාකරන සහකාර I ශ්‍රේණියට 2016.11.01 දින සිට උසස් කරන ලදී.

## 3.3 නව බඳවා ගැනීම

අරමුදලේ අනුමත සේවක සංඛ්‍යාවෙහි එනම් එවක පැවති ගිණුම් නිලධාරී II තනතුර සඳහා එක් පුරප්පාඩුවකුත් කළමනාකරණ සහකාර III තනතුර සඳහා පුරප්පාඩු දෙකකුත් යන පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා නිල වෙබ් අඩවිය මගින් සහ පුවත්පත් දැන්වීම් හරහා ප්‍රචාරණය කිරීමෙන් පසුව ලද අයදුම්පත් අතුරින් සුදුසුකම් ලාභී අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් යටතේ ලිඛිත පරීක්ෂණයක් මෙහෙයවීමෙන් අනතුරුව විනිවිද භාවයකින් යුක්තව තොරා පත්කර ගන්නා ලදී.

කාර්යාල කාර්ය සහායක III යන ශ්‍රේණියේ තනතුරු සඳහා 2015.12.01 දින සිට අනියම් කාර්යාල කාර්ය සහායක III ලෙස සේවය කල නිලධාරියාව 2016.07.27 සිට එම පුරප්පාඩුව තිබූ තනතුරෙහි ස්ථිර කරන ලදී. තවද පුරප්පාඩුව පැවති රියදුරු තනතුර සඳහා 2016.07.01 දින සිට නව නිලධාරියෙකු බඳවා ගන්නා ලදී.

## 3.4 අරමුදල් පරිශ්‍රය වැඩි දියුණු කිරීම

දිගු කලක් තිස්සේ අබලන් තත්ත්වයේ පැවති ලෝහෝර් ආර්යා ණය අරමුදල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම 2015 වර්ෂයේ නොවැම්බර් මාසයේදී ආරම්භ කරන ලදී.රු.මි.23ක අඩු පිරිවැයක් ඉදිරිපත්කර තිබූ ලංසුකරුවා වූ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව අනුමත කොන්ත්‍රාත්කරු වශයෙන් භාරකාර මණ්ඩලයේ අනුමැතිය සහිතව තෝරා පත් කර ගත් අතර. මෙම අළුත්වැඩියා කර්තව්‍ය සඳහා වූ පිරිවිතර සකස්කිරීම සහ ගෙවීම් කටයුතු සිදුකිරීමේදී ප්‍රමාණාත්මක ක්‍රමවේදයන් අනුව ගෙවීම් බිල්පත් තක්සේරු වටිනාකම් මිනීම හා සුපරීක්ෂණය ඇතුළු සියළු උපදේශන සේවාවන් ලබා ගැනීමට රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව (SD & CC)පත්කර ගැනිමට තීරණය කරන ලදි.

**වගුව 09 - ලෝහෝර් ආර්යා ණය අරමුදල් ගොඩනැගිල්ල නවී කරණය**

| | | |
|---|---|---|
| **මුළු ඇස්තමේන්තු ගත මුදල** | | **23,462,043.69** |
| 2015 දී ලබා දුන් 20% ක අත්තිකාරම් මුදලක | | ( 4,692,408.73 ) |
| **2016 ආරම්භයේ දී ඉතිරි මුදල** | | **18,769,634.96** |
| 2016.06.27 දින පිරිවිතර පතේ වටිනාකම | 542,683.45 | |
| 2016.07.22 දින පිරිවිතර පතේ වටිනාකම | 2,152,120.47 | |
| 2016.12.20 දින පැවති උත්සවය වෙනුවෙන් අප ආයතනය විසින් ඔවුන් වෙත සපයාදුන් අමුද්‍රව්‍ය වටිනාකම | 91,165.00 | ( 2,785,968.92 ) |
| **2016 අවසානයේ දී ඉතිරි මුදල** | | **15,983,666.04** |

මේ අනුව 2016 වසර තුල නිම කරන ලද මුළු කාර්ය ප්‍රතිශතය 32% කි.

### 3.5 කාර්යාල කටයුතු නවීකරණය

අරමුදලේ කාර්යමණ්ඩලයේ සේවකයින්ට සිය විෂයන්ට හා කාර්යභාරයන්ට උචිත වන ලෙස අරමුදල මගින් ලබාදෙන පුහුණු වැඩසටහන් ඔස්සේ කාර්යමණ්ඩලයේ සිය විෂයන්ට හා කාර්යභාරයන්ට අදාල හැකියාවන් වර්ධනය වීමෙන් සහ සෑම නිලධාරියෙකුම තමන්ට අයත් රාජකාරි කටයුතු වලට පරිභාහිරව අනෙකුත් නිලධාරීන්ගේ කටයුතු පිළිබඳව අවබෝධයක් ලබා තිබීම අනිවාර්ය හෙයින් ඒ ඒ නිලධාරීන්ගේ රාජකාරි කටයුතු පිළිබඳව පුහුණුවක් ලබා දීමට කටයුතු කරන ලදී. ඒ හේතුවෙන් ආයතනික කටයුතු අඛණ්ඩව සහ බාධාවකින් තොරව කාර්යක්ෂමව කර ගෙන යාමේ හැකියාව වර්ධනය විය.

**අරමුදලේ උපස්ථ ගොනු (Backup Filles) ආරක්ෂිතව පවත්වාගෙන යාම.**

අප ණය අරමුදලේ ණය ගිණුම් පද්ධතිය සම්පූර්ණ වශයෙන් පරිගණක ගත කර ඇති අතර දෛනිකව එකී පරිගණක මෘදුකාංග පද්ධතියේ උපස්ථ ගොනු ලබා ගැනීම සිදු කරනු ලබයි. මීට අමතරව මසකට වරක් උපස්ථ ගොනුවක් ලබාගෙන එය මුදල් අමාත්‍යාංශයේ සුරක්ෂිත ස්ථානයක රඳවා තැබීම සුදුසු බවට විගණක සහ කළමණාකරන කමිටුව නිර්දේශ කර ඇත. ඒ අනුව 2016.10.31 දින ඉහත උපස්ථක ගොනුවක් DVD තැටියකට ඇතුලත් කර මුදල් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන) උපදෙස් අනුව එම උපස්ථ ගොනු සහිත DVD තැටිය මුදල් අමාත්‍යාංශය යටතේ පවතින පරිගණක ජාල මෙහෙයුම් මධ්‍යස්ථානයේ (NOC) වෙත යොමු කරන ලදී.

### 3.6 කාර්ය මණ්ඩල ණය

ණයකරුගේ සහ ඇපකරු දෙදෙනාගේ වසර 05 ක ස්ථිර සේවා කාලය සහ 40% වැටුප් සීමාව සලකා බලමින් ණය ලබා දීමේ ක්‍රමය ක්‍රියාත්මක කරන ලද අතර 2016 වර්ෂයේ දී 8% පොලී ප්‍රතිශතය මත ලබා දුන් රු:100,000/- ණය ක්‍රම වේදයේ වෙනසක් සිදුකරන ලද අතර ඉන් එක් ක්‍රම වේදයක් යටතේ පමණක් එක් අයෙකුට එක් ණය මුදලක් ඉල්ලුම් කළ හැක.

### 3.7 ලේක්හවුස් පොත්හල ඉවත්වීම හා තැන්පතු මුදල් නිදහස් කිරීම

ලේක්හවුස් පොත්හල සහ අරමුදල අතර දීර්ඝ කාලීනව කුලී පදනම යටතේ පැවති බදු ගිවිසුම කුලී වාරික නියමිත කාල සීමාවන් තුල නොගෙවීම හේතුවෙන් ඇති වූ හිඟතාවය මත 2016.02.29 වන දින මෙම ගිවිසුම අත්හිටුවන ලදී.

ගිවිසුමේ විධිවිධාන වලට අනුකූල නොවන පරිදි බදු කුලී අරමුදල වෙත හිඟව ගෙවීම හේතුවෙන් එම සියළුම හිඟ ණය වාරික ලේක් හවුස් පොත් හල අප අරමුදල වෙත රඳවා තබා ඇති තැන්පතු මුදලින් පියවා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

ඒ පිළිබඳ විස්තර පහත පරිදි වගුවෙන් දැක්වේ.

| තොරතුරු | | රු. | රු. |
|---|---|---|---|
| තැන්පතු මුදල 2016.01.01 | | | **2,531,750.00** |
| හිග බදු කුළිය | | | |
| **2015** | සැප්තැම්බර් | 240,031.00 | |
| | ඔක්තෝම්බර් | 422,875.00 | |
| | නොවැම්බර් | 422,875.00 | |
| | දෙසැම්බර් | 422,875.00 | |
| **2016** | පෙබරවාරි | 422,875.00 | |
| | ජනවාරි | 422,875.00 | |
| 29.02.2016 දිනට හිග බදු කුළිය | | 2,354,406.00 | (2,354,406.00) |
| හිග බදු කුළිය අඩු කිරීමෙන් පසු ඉතිරිය | | | **177,344.00** |
| | මාර්තු | 185,808.13 | |
| | අප්‍රේල් | 185,808.13 | (371,616.26 ) |
| තව දුරටත් පවතින හිගය | | | **194,272.26** |
| ලදුපත් අංක 169427 යටතේ ලද මුදල | | | **(194,272.26 )** |
| ශේෂය | | | 0 |

